**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.01.19 පැය 2050 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/ 96 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**අයහපත් කාලගුණය හේතුවෙන් අනුරාධපුරය දිස්ත්‍රික්කයේ මාර්ග කිහිපයක ගමනාගමනය අවහිර වීම සම්බන්ධව - පොලිස් මූලස්ථානය.**

2025.01.19 වන අද දින පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් අනුරාධපුරය දිස්ත්‍රික්කයේ ප්‍රදේශ කිහිපයක මාගර් ජලයෙන් යටවීම හේතුවෙන් ගමනාගමනය අවහිර වී ඇත. එම මාගර්යන් වනුයේ,

- උඩමළුව පොලිස් වසමේ කොහොඹගස් හන්දිය මල්වතුඔය පාලම අතර කොටස මල්වතුඔය පිටාර ගැලීම හේතුවෙන් ගමනාගමනය සම්පූණර්යෙන්ම අවහිර වී ඇත.

- ගල්නෑව පොලිස් වසමේ අවුකන සිට වලව්වේගම හරහා කලාවැව මාගර්යේ අවුකන විහාරය ආසන්නයේ ජලයෙන් යටවීම හේතුවෙන් ගමනාගමනය සම්පූණර්යෙන්ම අවහිර වී ඇත. තවද ගල්නෑව සිට අළුබද්ද හරහා හිරිපිටියාගම මාගර්ය හඳුන්ගම පාලම ආසන්නයේ ජලයෙන් යටවීම හේතුවෙන් ගමනාගමනය අවහිර වී ඇත.

- තන්තිරිමලය පොලිස් වසමේ තත්තිරිමලය සෙට්ටිකුලම මාගර්යේ බෝගොඩ පාලම ආසන්න ජලයෙන් යටවීම හේතුවෙන් ගමනාගමනයද අවහිර වී ඇත.

ජල ගැලීම් සිදු වූ ස්ථානයන්හි දැන්වීම් පුවරු යොදා විකල්ප මාගර් සඳහන් කර මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කර ඇත. එම ස්ථානයන්හි රථවාහන නිලධාරීන් රාජකාරි යෙදවීමට කටයුතු කර ඇති අතර ඔවුන්ගේ උපදෙස් පිලිපදින ලෙස ඉහත ප්‍රදේශවල හරහා ගමන් කරන මහජනතාවගෙන් හා රියදුරන්ගෙන් පොලිසිය ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**